# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාව
# ‘උපනිස්සය ප්‍රත්‍යය’
## 25.10.2018

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥ ධර්ම රාජයාණන් වහන්සේට සැදැහැ සිතෙන් ගෞරවයෙන් වැඳ නමස්කාරය කරනවා, මාගේ නමස්කාරය වේවා! සියලුම සත්වයන් කෙරෙහි පතල කරුණාවෙන් තමන්වහන්සේ අවබෝධ කොට ගත්තා වූ ශ්‍රී සත්ධර්මය ලෝකයා කෙරෙහි පතල මහා කරුණාවෙන් දේශනාකොට වදාළා වූ තථාගතයන් වහන්සේටත් ඒ දේශිත ධර්මයටත් මම සිරසින් වැඳ නමස්කාරය කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ උතුම් ධර්ම මාර්ගයේ ගමන්කොට සුපටිපන්න ආදී පිළිවෙතෙහි පිළිපැද ආහුනෙයිය ආදී ගුණ ධාරීව ලෝකයාට පුණ්‍යක්ෂේත්‍රයක් වූ අනන්ත ගුණ ඇති මහා සංඝ රත්නට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ධම්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත අපරිමාණ ගුණ ආනුභාව බලයෙනුත් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධරත්නය ගැන හිතීමේ මෙනෙහි කිරීමේ චිත්තක්ෂණයක් හෝ වන්දනා කර ගැනීමේ කුසල බලයෙනුත් අසාගෙන සිටින්නා වූ ශ්‍රාවක පක්ෂය විසින් මේ දක්වාම උපදවා ගෙන තිබෙන දාන සීල භාවනා ආදී උතුම් කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙනුත් අදත් අපි මේ පින්වත් සැම දෙනාටම කියලා දෙන්න බලාපොරොත්තු වෙන ධර්ම කරුණු ඉතාමත්ම හොඳින් නිරවුල්ව පැහැදිලිව තේරුම් ගන්න හැකි වේවා! සැමදෙනාගේම සිත් වලට නීවරණ ධර්මයන්ගෙන් බලපෑමක් ඇති නොවේවා! ධර්මයෙන් හිත ආරක්ෂා වේවා! මනසිකාරය ඇතිකරගෙන සිහිය නුවණ යොදාගෙන පැහැදිලි සිතින් මනසිකාරයෙන් ශ්‍රද්ධාවෙන් ධර්මය අසාගෙන මෙය මාර්ගයක් කොටගෙන ප්‍රතිපදාවක් කොටගෙන මේ පිනේ බලයෙනුත් ධර්ම මාර්ගයේ ගමන් කිරීමෙන් නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා, ප්‍රාර්ථනා කරනවා.

එසේ ප්‍රාර්ථනා කරමින් තමයි අද මේ පින්වතුන්ට මම වෙන් කරගත්ත ධර්ම කොට්ඨාසය කියලා දෙන්නේ. අපි අද කථා කරන්නේ ‘උපනිශ්‍රය ප්‍රත්‍යය’ පිළිබඳව ඉදිරිපත් වෙන ධර්ම කොට්ඨාශය. නිශ්‍රය ප්‍රත්‍යයයේ සහ උපනිශ්‍රය ප්‍රත්‍යයයේ තිබෙනවා වෙනස් ස්වභාවයක්. අපි යම් කිසි දේකට භූමියක්වන, ක්ෂේත්‍රයක්වන, ධර්මයක්වන, කාරණයක්වන, පදනමක්වන දේ ‘නිශ්‍රය ධර්මය’ හැටියට තේරුම් ගත්තා. ‘උපනිශ්‍රය’ කියලා කියන්නේ ඒකෙම වෙනස් ස්වරූපයක් ගත්ත දෙයක්. උපනිශ්‍රය ප්‍රත්‍යය

හරියට කියනවා නම් 'බලවත් වූ හේතුවකට' 'බලවත් වූ කාරණයකට' 'බලවත් වූ උපකාරක ධර්මයකට' කියනවා උපනිශ්‍රය වන ප්‍රත්‍යය කියලා.

අපි හැම කෙනාගේම තිබෙනවා ජීවිතියේ සම්මුති හැටියට ගත්ත මනුස්සයා දෙවියා සත්වයා යන හැම කෙනා තුලම පරමාර්ථ ධර්ම හැටියට ක්‍රියාත්මක වන ධර්ම කාණ්ඩ හතරක් තිබෙනවා. 'චිත්ත ධර්මය' 'චෛතසික ධර්මය' 'රූප ධර්මය' 'නිර්වාණ ධර්මය' කියලා. චිත්ත චෛතසික රූප නිර්වාණ කියන ධර්මතා හතරෙන් මේ චිත්ත චෛතසිකයෝ ලෞකික පැත්තට බර වෙලා තිබෙන හේතු ඵල ධර්මයන්හි ක්‍රියාත්මක වෙන ධර්ම ස්වභාවයක්. ඒ චිත්ත චෛතසික ධර්මයෝ ඇතිවෙන්නේ මතුවන්නේ උපදින්නේ යම් කිසි හේතුවක් ඇතිවයි. ආන්න ඒ චිත්ත චෛතසික ධර්මයෝ මතුවෙන්න හටගන්න උපදින්න ඉදිරිපත් වන බලවත්ම හේතුවට බලවත්ම කාරණයට කියනවා **'උපනිශ්‍රය ධර්මය'** හෙවත් **'උපනිශ්‍රය ප්‍රත්‍යය'** ස්වභාවය කියලා. උපනිශ්‍රය ප්‍රත්‍යයයේ තිබෙන්නා වූ කරුණු ටිකක් තමයි අද අපි කථා කරන්න යන්නේ. ඒ උපනිශ්‍රය ප්‍රත්‍යය මීට ඉස්සරවෙලා අපි කියලා තිබෙනවා. නමුත් මේ කාරණයට බැස ගැනීම සඳහා මේකේ මතුකර දීමක් කරන්න වෙනවා.

හිතක් පහළ වෙන්නේ දැනට පහළ වෙන්නා වූ හිතට කලියෙන් තිබුණ හිතක යම් කිසි තල්ලුවක් බල පෑමක් උපකාරක ධර්ම ස්වභාවයක් නිසා. ඉස්සෙල්ලා පහළ වෙච්ච හිතෙන් මොකක් හරි දෙයක් අල්ලලා කියලා හුරු කරලා දුන්නේ නැත්නම් ඊළඟ හිත පහළ වෙන්නේ නෑ. ඒක නිසා හිතක් පහළ වෙනකොට ඒ හිතට ඉස්සරවෙලා ඇති වෙච්ච හිතෙන්, ඒ චෛතසික ධර්මයන්ගෙන් ලැබෙන්නා වූ බලවත් උපකාරයක් තිබෙනවා. ඒ බලවත් උපකාරයට **'උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය'** **'උපනිශ්‍රය ප්‍රත්‍යය ගුණය'** කියලා හඳුන්වනවා. ඒ ඉස්සෙල්ලා හිතෙන් ලබාදෙන ශක්තිය ආකාර තුනකට විදි තුනකට ක්‍රම තුනකට පෙන්නුම් කරනවා, විස්තර කරනවා.

අපි දැනගත්තා මීට කලියෙනුත් උපනිශ්‍රය ප්‍රත්‍යය තුන් ආකාරයට විස්තර වෙනවා. **'ආරම්මණ වශයෙන්' 'අනන්තර වශයෙන්'** සහ **'ප්‍රකෘති වශයෙන්'**. ඒ කියන්නේ ආරම්මණය උපනිශ්‍රය ප්‍රත්‍යයක් වෙනවා. ඒකට කියනවා ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය කියලා. අනිත් එක තමයි කලින් පහළ වෙන සිත අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා. අනිත් එක ප්‍රකෘතියක් හැටියට ස්වභාවයෙන් ඉදිරිපත් වෙන කාරණයක් හැටියට ඉදිරිපත් වෙනවා ප්‍රකෘති උපනිශ්‍රය කියලා. ඉතින් මේක අහගෙන ඉන්නා වූ මේ පින්වතුන්ට අද මේ කියලා දෙන්නේ උපනිශ්‍රය ධර්ම ස්වභාවය නිසා ඒක විශේෂිත බලවත්ම කාරණයක් වෙන නිසා මේකේ ප්‍රභේදයත් කියලා ඕනෑ ඉස්සරහට යන්න. මේක තුන් ආකාරයකට විස්තර කරන නිසා අපිට තුන් ආකරයකටම මේක ගෙනියන්න සිද්ධ වෙනවා. නැත්නම් තේරුම් ගැනීමේදී තිබෙනවා ගැටළු තැන් සහ හිර වෙන් තැන්. අපේ මේ අහගෙන ඉන්න පින්වතුන්ට මේ ධර්ම කාරණා ටිකේ ක්‍රියා කාරී ස්වභාවය කියනවා නම් හරියට කාන්දම් කැල්ලක් ඇල්ලුවහම ඒ කාන්දම් කැල්ලට පුංචි පුංචි අල්පෙනෙත්ති වගේ දේවල් ඇදලා ගන්න ගතියක් තිබෙනවා. අපිට කාන්දම් කැල්ල පේනවා. අල්ලන්න පුළුවන්. ඒකට බරකුත් තිබෙනවා.

ඒවගේම ඇල්පෙනෙත්තක් ඉදිකටුවක් වගේ ග්‍රහණය වෙන වස්තුවත් අපිට පුළුවන් දැකගන්න. නමුත් ඒ කාන්දම් කැල්ලේ තිබෙන්නා වූ ඒ ඇද ගැනීමේ ගුණ ස්වභාවය ඇද ගැනීමේ ශක්තිය කුමන වර්ගයේ එකක්ද කියන එක තේරුම් ගන්න අමාරුයි. නමුත් කාන්දම් කැල්ලට පුංචි වස්තුවක් ඇදී යන විදිය නම් පේනවා. ඒ උනාට ඒ ඇදී යෑමේදී ක්‍රියාත්මක වෙන ක්‍රියා කාරී ස්වභාවය හරි සියුම්. ඒ වගේ තමයි හිතක් පහළ වෙලා ඒ හිත නැති වෙනකොට තව හිතක් පහළ වෙනවා. තවත් හිතක් පහළ වෙනකොට ඒ පහළ වෙන හිතට කලින් පහළ වෙලා තිබෙන්නා වූ හිතින් යම් කිසි බලයක් යම් කිසි ගැම්මක් ප්‍රධාන කාරණයක් ලෙස ඉස්සරහට තල්ලුවක් දීලා ඊළඟට ඇති වීමක් කරන්න පුළුවන් යම් කිසි ශක්තියක් තිබෙනවා.

අපි හිතමු මෙහෙම. ඉස්සර වෙලා පහළ වෙච්ච සිතේ තිබෙන්නේ සිතයි චෛතසික ධර්ම ගොඩකුයි. ඔය චිත්ත චෛතසික රංචුවෙන් දෙවෙනි සිත පහළ වෙනකොට ඒ දෙවෙනි සිතට මතුවෙන්න ඔය ඔක්කෝගෙන්ම එකක් ලොකු බලගැන්වීමක් කරනවා, ඔක්කොම නොවෙයි. ආන්න ඒ බල ගන්වන එකට කියන්නේ උපනිශ්‍රය කියලා. එකකට ආරම්මණ උපනිශ්‍රය කියලා කියනවා. ආරම්මණ උපනිශ්‍රය කියලා කියන්නේ යම් කිසි චිත්ත චෛතසික සමූහයක් පහළ වෙන්න අරමුණක් හැටියට ඉදිරිපත් වෙලා එන එකට. අපි ඉස්සර වෙලාම අන්න ඒ කාරණය තේරුම් ගනිමු, අනන්තර ස්වභාවයට යන්න කලින්.

දැන් බලන්න මෙහෙම. ප්‍රායෝගිකව බැලුවහම මේ වේලාවේදී අපි මේ අභිධර්ම සාකච්ඡාව සිද්ධ කරනවා. මේ ධර්ම සාකච්ඡාව සිද්ධ කරනවා කියලා කියන්නේ චිත්ත චෛතසික ටිකක් දැන් ක්‍රියාත්මක වෙනවා. ඒ චිත්ත චෛතසික ටික ක්‍රියාත්මක වෙන්න මොනවා හරි දෙයක් අවශ්‍යයයි. දැන් මේ බණ ඇසීම මේ ධර්ම සාකච්ඡාව කියන එක වටේ තමයි ඔය විසාල පිරිසකගේ හිත් වල ධර්මය අරමුණු කරන සිත් සහ චෛතසික ටික ගොනුවෙලා මතුවෙන්නේ. බණ ඇසීම කියන කාරණය ප්‍රධාන කාරණයක්, විශේෂ කාරණයක් වෙනවා. ඊළඟට අපි හිතමු ගිය සතියේ අපි බණක් ඇහුවා කියලා. ඒ ගිය සතියේ ඇසුවා වූ බණ මේ වේලාවේදී අතීත වශයෙන් හිතනවා. ගිය මාසයේ අහපු බණ අපි අතීත වශයෙන් හිතනවා. දැන් ටිකකට කලියෙන් කියපු බණ හිතනවා. එහෙම ඒ කියපු දේ හිතන කොට අහපු දේ හිතන කොට දැන් පහළ වෙන චිත්ත චෛතසික පහළ වෙන්නේ පරණ දෙයක් අරමුණු කරගෙන යම් කිසි සිද්ධියක් කාරණයක් මුල් කරගෙනයි. බණ ඇසීමක් මුල් කරගෙන. අන්න ඒක අරමුණු කරගන්න කොට ඒ පරණ දේ, අහපු කාරණය, අහපු බණ, හිතපු බණ, අහපු ප්‍රශ්න සියල්ලම ආරම්මණ වශයෙන් මේවාට බල පානවා.

ඒවගේ අපි හිතමු සීල සමාදානයක් හෝ දන් දීමක් හෝ වෙනත් මොකක් හරි උත්සවාකාරයෙන් සිද්ධ කරපු දෙයක් නැවත නැවත මෙනෙහි කරනකොට ඒ මෙනෙහි කරන සිත් වලට ඒ කරපු පින්කම් ලොකුවට ලොකුවට අරමුණු වෙනවා. ඒවගේම බලන්න දැන් මාසයකට දෙකකට කලින් අපි අනුරාධපුරයේ ලොකු පින්කමක් කළා. ඒ අනුරාධපුර පින්කමේ සිද්ධිය ලොකුවට ප්‍රධාන වශයෙන් අරමුණු වෙලා අපිට ඒ

පිළිබඳව සිද්ධ වෙච්ච විදිය මතක් වෙනවා. අගෝස්තු මාසයේ සිදුවෙච්ච කරුණු මොනවාද, මොනවාද අපි කරලා තිබෙන්නේ, මොනවාද අපි සම්බන්ධ වෙච්ච දේවල් කියලා හිතුවොත් ඔය පින්කමත් එකකට එනවා. නමුත් එම මාසයේ සිද්ධ කළේ ඒ පිංකම පමණක් නොවෙයි. තව ගොඩක් කරුණු කාරණා, ගිය ගමන් බිමන් සහ සිදු කරපු තවත් දේවල් තිබෙනවා. නමුත් ඒ අතරින් මේ පිංකම කියන එක ඉලිප්පිලා එනවා. ආන්න ඒ ඉලිප්පිලා ප්‍රධාන වශයෙන් අපේ හිත ඒකට අද්දලා ගන්න කොට ඒකට කියනවා 'උපනිශ්‍රය ස්වභාවය' 'උපනිශ්‍රය ශක්තිය' කියලා. ආරම්මණ වශයෙන් ඒක උපනිශ්‍රය වෙනවා. ඒ කියන්නේ ඒ බලවත් කාරණයට පුළුවන් අපේ හිත තදින් අද්දලා ගන්න. මේ වගේ අපේ හිත්වලට අරමුණු වන දේවල් තිබෙනවා. තක්සේරු කරලා ගත්තයින් පස්සේ විසාල ස්වභාවයේ දේවලුත් තිබෙනවා, පොඩියට පොඩියට තිබෙන දේවලුත් තිබෙනවා. ඒකෙන් අපේ හිතේ ආරම්මණය ලොකුවට හදලා ඒ ආරම්මණය නිසා චිත්ත චෛතසිකයන් ඉලිප්පිලා මතුවෙලා එන එකට කියනවා 'ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය' කියලා.

මේ ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය හදන්න තායිලන්තයේ එක වැඩක් කරනවා. තායිලන්තයේ තිබෙනවා අවුරුද්දකට සැරයක් කරන මහා විසාල පිංකමක්. ස්වාමීන්වහන්සේලා ලක්ෂ ගානක් ඇවිල්ලා පෙළ ගැහිලා තමයි ඒක කරන්නේ. ඒකෙ පරමාර්ථය ඇහුවම දැන ගන්න ලැබෙන්නේ උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය දීමට කියලා. ඒ කියන්නේ මරණාසන්න අවස්ථාවේදී ඒ මරණය අත්වෙන එක්කෙනාට දිව්‍යලෝක ආදී ස්ථානවල උපදින්න ලොකුවට මතුවෙන ශ්‍රද්ධාව ඉතිරෙන ලොකු ආරම්මණයක් හදලා දීමටලු එහෙම grand scale එහෙකින් එහෙම කරන්නේ. අපි ජීවිතියේ කරපු කියපු තවත් දේවල් ගොඩක් තිබෙනවා. නමුත් මේක ලොකුවට අල්ලලා දුන්නහම ආරම්මණය වශයෙන් විසාල බලවත් එකක් වෙනවා.

ඒවගේම හිතට අරමුණු වෙන තවත් බොහෝ දේවල් තිබෙනවා. හිතට අරමුණු වෙන දේවල් වලින් සමහර ඒවා තිබෙනවා වැද ගැම්මක් නෑ. ඒවායේ ඒ තරම් හිත රැඳෙන්නේ නෑ. සමහර ඒවා තිබෙනවා අරමුණු ගරු කිරීමත් පිළිගැනීමත් තබා ගැනීමත් හොඳ නිසා ඒ අරමුණු වලට aim වෙලා ඒ පැත්තට හැරිලා චිත්ත චෛතසික පහළ වෙන්න ඒවා හේතුවක් වෙනවා. ඒකට කියනවා 'ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය' කියලා. හොඳ පැත්තටත් එහෙමයි. නරක පැත්තටත් එහෙමයි.

අකුසල් සිත් පහළ වෙන්න, රාග දෝස පහළ වෙන්න අරමුණු හේතුවෙනවා. සමහර වෙලාවට දෘෂ්ඨිය හරි බලවත්. ඒවගේ දෘෂ්ඨිගත වෙනකොට තණ්හාව පහළ වෙනකොට ඒ ලෝභයට බැස ගන්න, සතුටු වෙන්න, ලෝභයට ගිහිල්ලා ඒකෙ ගැවසෙන්න ලෝභයට ගරු වෙන ආරම්මණයක් තිබෙනවා නම් ඒකට කියනවා ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය ස්වභාවය කියලා.

දැන් මේ මම කිව්වේ ආරම්මණයේ බලවත් කමයි. ආරම්මණයේ බලවත්කම නිසා කොහොමද චිත්ත චෛතසික පහළ වෙන්නේ කියලා.

ඊළඟට තව එකක් තිබෙනවා. ඒ තමයි මේ අරමුණු වීම කියන එක වර්තමානයේ විතරක් නොවෙයි, වර්තමානයයි අතීතයයි අනාගතයයි කියන අවස්ථා තුනටම අදාලයි. අපි පරණ සිද්ධ දේවල් අරමුණු කිරීමෙන් සිත් පහළ කරගන්නවා. ඊළඟට අනාගතයේ කරන්න තිබෙන දේවල් ගැන හිතලා සිත් පහළ කරගන්නවා. වර්තමානයේ තිබෙන දේවල් සම්බන්ධයෙන් සිත් පහළ කරගන්නවා. අතීතයටම ගියහමත් මහා ලොකු ප්‍රධාන වශයෙන් සිද්ධ වෙච්ච දේවල් තිබෙනවා. අනාගතයේදී කරන්න තිබෙන දේවල් වලත් තිබෙනවා. වර්තමානයේත් යම් යම් දේවල් වලත් තිබෙනවා. ඔය කියන්නා වූ දේවල් අරමුණු කරනකොට ඔය විදියට ස්ථාන තුනකට ප්‍රධාන වශයෙන් යනවා. අකුසල පැත්තටත් එහෙමයි, කුසල පැත්තටත් එහෙමයි.

දැන් මේ ආරම්මණ ප්‍රත්‍යයට අනුකූලව කථා කරන, ඒ ගැන විග්‍රහ කරන වීථී ක්‍රමයක් අරගෙන බලමු.

**<u>පළවෙනි වීථිය</u> - කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සයපච්චයෙන පච්චයො – ආරම්මණූපනිස්සයො, අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො.**

මෙයින් කියන්නේ කුසල ධර්මයක් තවත් කුසල ධර්මයකට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙන බවයි. මෙහි කරුණු තුනක් කියනවා. ආරම්මණ උපනිශ්‍රය වශයෙන් අනන්තර උපනිශ්‍රය වශයෙන් සහ ප්‍රකෘති උපනිශ්‍රය වශයෙන්. මේ තුනෙන් අපි දැන් කථා කරන්නේ ආරම්මණ උපනිශ්‍රය ස්වභාව පමණයි.

ඒක සිද්ධ වෙනවා මෙහෙම.

1) <u>ආරම්මණ උපනිස්සය ප්‍රත්‍යය</u> – **දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා, තං ගරුං කත්වා පච්චවෙක්ඛති** = දානයක් දීලා සීලමය පිංකමක් සිද්ධ කරලා පොහොයට සිල් සමාදන් වීමක් සිද්ධ කරලා ඒ කරපු දෙය 'හරි හොඳයි' 'හරි වටිනවා' 'මට සිද්ධ වෙච්ච දෙය හරි හොඳයි' කියලා මෙනෙහි කරනවා. එහෙම මෙනෙහි කරනවා කියලා කියන්නේ අතීතයේ කරපු දේකට හිත හරවනවා. ඒ ගැන හොඳට මෙනෙහි කරනවා. අන්න ඒ වෙලාවේදී පහළ වෙන්නා වූ චිත්ත චෛතසික ධර්ම සමුදායට, මේ නාම ධර්ම සමුදායට ඒ කරපු ලොකු වැඩ 'ආරම්මණ උපනිශ්‍රය ශක්තියෙන්' ශක්තිමත් වෙනවා. මෙහෙම ශක්තිමත් වෙලා ඒක සමහර වෙලාවට යන්නේ නෑ. ඒ තරමට බලවත් වෙනවා. අපි හිතමු දඹදිව ගියා කියලා. ඒ වගේ දේවල් සාමාන්‍ය දේවල් නොවෙයි. එතකොට හිත ඒ පැත්තට හැරිලා උදේට නැගිටින කොටත් ඒක මතක් වෙනවා. ඒවගේම හැන්දෑවට මතක් වෙනවා. තවත් කවුරු හරි කෙනෙක් එහෙ ගියානම් ඒ සම්බන්ධව මතක් වෙනවා. ඒ වගේ කුසල ධර්ම සමුදායක් නැවත නැවත පහළ වීමට ඉස්සරවෙලා කරපු පිංකම තමන්ට උපකාර වෙනවා. ඒ උපකාර වෙන බවට කියනවා **ආරම්මණ උපනිශ්‍රය ස්වභාවය** කියලා.

2) **පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා පච්චවෙක්ඛති** = තමන් විසින් පෙර කරපු හොඳ දේවල් නැවත නැවත හිත හිතා බල බලා ඉන්නවා. එතකොටත් වෙන්නේ ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීමයි.

මේ කරුණු දෙක සාමාන්‍යයෙන් ලොකු අරමුණු දෙකක්. ඒ කියන්නේ සීලමය වශයෙන් සහ සුචිණ්ණ කර්ම ධර්ම වශයෙන්.

නැවතත් මහග්ගත හැටියට මේ විදියට කියනවා. මහග්ගත කියලා කියන්නේ කාමාවචර ආරම්මණ වලින් ටිකක් උඩට ගිය තැන. ධ්‍යාන අභිඤ්ඤා සහ ලෝකෝත්තර සිත්.

3) **ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා පච්චවෙක්ඛති** = ධ්‍යානයකට පත්වෙලා ධ්‍යාන ආරම්මණයත් එක්ක ඉඳලා ධ්‍යානයෙන් ගොඩ ඇවිල්ලා ධ්‍යාන ආරම්මණය පිළිබඳව ධ්‍යානයේ තිබෙන සැපය ශාන්තිය මෙනෙහි කරමින් ප්‍රත්‍යයවේක්ෂා කරනවා, හිතා බලනවා. අත් විඳපු ධ්‍යානයක් දෙස ආපසු හැරී බලන එකට කියනවා මහග්ගත සිත් කුසලාරම්මණික වශයෙන් අරමුණු කරනවා කියලා. මේ අවස්ථාවේදීත් පහළ වෙන සිත් ඔක්කොම අරමුණු කරන්නේ හොඳ අරමුණු. මෙතැන තිබෙන්නේත් 'ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය' ශක්තිය.

දානමය වශයෙන් කාමාවචර ආරම්මණය, උපෝසිත වශයෙන් කාමාවචර ආරම්මණය, වෙනත් වෙනත් යහපත් දේවල් කිරීම වශයෙන් සුචිණ්ණ කර්ම ආරම්මණය යන මේ ටිකට පස්සේ තිබෙනවා මහග්ගත සිත්. තවත් ඉදිරියට ගියාට පස්සේ තිබෙනවා සේක පුද්ගලයා පිළිබඳව. ඒ කියන්නේ සෝවාන් සකෘදාගාමී අනාගාමී තත්වයට පත්වූ ආර්ය උත්තමයෝ පිළිබඳව.

4) **සෙක්ඛා ගොත්‍රභුං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති** = ඒ කියන්නේ සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත් වෙලා ඒ තත්වයට ගොඩ වෙලා ඉන්න ආර්ය උතුමන්ට ඉතාම වටිනා උතුම්ම දේ තමයි 'මාර්ග සිත්' 'ඵල සිත්' සහ විශේෂයෙන්ම මෙතැන තිබෙනවා මාර්ග සිත දෙසට සිත හරවා දෙන්නා වූ සිත. ඒ තමයි නිර්වාණය පැත්තට හිත හරවන ගැම්ම ලබාදෙන 'ගෝත්‍ර භූ සිත'. කෙළෙස් නැති කළේ සහ නිවන හොඳට ස්පර්ශ කරලා දැන ගත්තේ මාර්ග සිතෙන්. ඒ මාර්ග සිතට කලින් සිත හරවන තැනක් තිබෙනවා. ඒකට කියනවා 'ගෝත්‍ර භූ' අවස්ථාව කියලා. ඒ පෙර පහළ වූ 'ගෝත්‍ර භූ' සිත පස්සේ වෙනත් හිතකින් මෙනෙහි කරනවා. ඒක මෙනෙහි කරන්නේ කාමාවචර ජවන් සිත් වලින්. කාමාවචර ජවන් සිත් මේ වෙලාවේ පහළ වෙනවා නම් ඒ හිතට අරමුණු වෙන්නේ 'මම මේ විදියටයි ධර්මට ගියේ, මේ විදියටයි නිවනට ගියේ' කියලා නිවන දෙසට හැරිච්ච විදිය මෙනෙහි වෙනවා.

මේකෙදී හරි පරෙස්සම් වෙන්න ඕනෑ මේ පින්වතුන්. ඒ කියන්නේ, සේක පුද්ගලයෝ නිවන් අරමුණ කරගෙන ඉන්න වෙලාවක නොවෙයි ඔය 'ගෝත්‍ර භූ' සිත මෙනෙහි කරන්නේ. නිවන් අරමුණු කරගෙන ඉන්න වෙලාවට ඒක කෙරෙන්නේ මාර්ග සිතෙන් නැත්නම් ඵල සිතෙන්. එහෙම වෙලාවක් නොවෙයි මේ කථා කරන්නේ. මේ කියන්නේ

කාමාවචර කුසල් සිත් වලට අරමුණු වන දේ. කාමාවචර කුසල් සිතකින් තමයි 'ගෝත්‍ර භූ' සිත අරමුණු කරන්නේ. කාමාවචර සිතකින් නිවන් අරමුණු කරන්න බෑ. කාමාවචර සිත් ඒකට සුදුසු නෑ. නිවන් අවබෝධ කරන්න ලෝකෝත්තර සිතක් තිබෙන්න ඕනෑ. නමුත් පළවෙනියටම නිවනට හැරෙන 'ගෝත්‍ර භූ' සිතින් එහෙම දෙයක් උනා කියන බව විතරක් කාමාවචර සිතකින් දැන ගන්න පුළුවන්. මේක සිද්ධ වෙන්නේ චිත්ත වීථියක ක්‍රමානුකූලව.

අපි ඉස්සෙල්ලා කිව්වා 'ගෝත්‍ර භූ' සිතක් ඇතිවෙන්නේ කොහොමද කියලා. ධර්මය හොඳට මෙනෙහි කරලා මෙනෙහි කරලා සංස්කාරයන්ගේ ලක්ෂණ දැනගෙන ලක්ෂණ දැකගෙන ඒවාගේ තිබෙන්නා වූ බිඳී යන අනිත්‍යය ලක්ෂණය හෝ දුක්ඛ ස්වභාවය හෝ පවත්වන්න නොහැකි ලක්ෂණය හෝ එහි කිසිම ආත්මීයත්වයක් නෑ කියන එක තේරුම් ගන්න කොට ඒක දිහා බලාගෙන ඉන්න වේලාවේදී ඒකෙන් ඉවත් වෙලා එහෙම නැති තැනක් තිබෙනවා කියලා දැනගන්න හැරෙන තැන. ඒක ඇති වෙන්නේ භවාංග සිත කඩාගෙන ඒවාගේම භවාංග සිත අයින් වෙලා ඊට පස්සේ මනෝ ද්වාරයේ තිබෙන ශක්තිමත් හැර වීමකින් සිත වෙන පැත්තකට හරවනවා. ඊට පස්සේ ඇතිවෙනවා පරිකර්ම වශයෙන් උපචාර වශයෙන් අනුලෝම වශයෙන් කියලා පිළිවෙලකට සිත් තුනක් පහළ වෙනවා, මනොද්වරා වර්ජනයෙන් පස්සේ. මෙහෙම ඤාණ සම්ප්‍රයුක්ත සිත් පහළ උනාට පස්සේ තමයි නිර්වාණය අරමුණු කරන්නා වූ නිර්වාණය පැත්තට හැරී පහළ වෙන්නා වූ ගෝත්‍ර භූ කියන්නා වූ සිත ශාන්තව උපදින්නේ. ඒ සිතට අනතුරුව පහළ වෙන්නේ කෙළෙස් නසන දවන නිර්වාණය හොඳට අහුකරගන්න 'මාර්ග සිත'. මාර්ග සිතට කලින් පහළ වෙන 'ගෝත්‍ර භූ සිත' අරමුණු කරන එක තමයි මේ කියන්නේ. ඒ බව තමයි **සෙක්ඛා ගොත්‍රභුං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති** කියලා කියන්නේ.

කෙනෙකුට හිතෙන්න පුළුවන් සකෘදාගාමී අනාගාමී තත්වය ගියාවූ ආර්යන් වහන්සේලාත් 'ගෝත්‍ර භූ සිත' අරමුණු කරනවද කියලා. ඒ ආර්යන් වහසේලාට 'ගෝත්‍ර භූ' අවස්ථාව අදාළ වෙන්නේ නෑ. හේතුව, නිර්වාණයට ඉස්සෙල්ලාම හැරිච්ච තැන තමයි 'ගෝත්‍ර භූ' සිත තිබෙන්නේ. ඒක සෝවාන් මාර්ගය. ඒ ආර්යන් වහන්සේලාට 'ගෝත්‍ර භූ' සිත වෙනුවට තිබෙන්නේ පිරිසුදු කිරීම් වශයෙන් පැහදිලිව පහළ වෙන්නා වූ වොදාන සිතයි. ඒක නිසා කියනවා

**5)** **සෙක්ඛා වොදානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති** = සකෘදාගාමී අනාගාමී ආදී ඉහළ තත්වයන්ට පත් වූ ආර්යන් වහන්සේලාට ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ උන්වහන්සේලාගේ වෝදාන චිත්තයයි.

මේ වෝදාන කියන සිත මාර්ග චිත්තය ගාවටම කලින් ගෝත්‍රභූ සිත පහළ වෙච්ච තැන පහළ වෙන්නේ. හැබැයි සකෘදාගාමී ආර්යන්ට ගෝත්‍රභූ සිත් නෑ. ඒ නිසයි 'වෝදාන සිත' පහළ වෙන්නේ.

**6)** **සෙක්ඛා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති**

සිදු වෙච්ච සිදු වීම පිළිබඳව, තමන් නිවන් අරමුණු කරපු බව පිළිබඳව, ගෝත්‍රභූ හිත හරහා සෝවාන් උනාවූ ද වෝදාන සිත හරහා නිවන් තහවරු කරගත්තා වූ සකෘදාගාමී අනාගාමී උත්තමයෝ ඒ මාර්ග සිතෙන් ලබා දීපු ශාන්තිය එහි තිබෙන ශක්තිය, නිවනට ගෙන ගිය විදිය, නිවන ස්පර්ශ කළ විදිය මෙනෙහි කරනකොට මාර්ග සිත ඒ අවස්ථාවේදී නැති නමුත් ඒ අතීතයේ වෙච්ච සිදුවීම පිළිබඳව මෙනෙහි කරනකොට ඒ මාර්ග සිත උන්වහන්සේලාට ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

මේ විදියට පෘතක්ජන භාවයේ සිටින්නා වූ කල්‍යාණ මිත්‍රයන්ටත් ඊළඟට ආර්ය භාවයට පත්වෙන්න ලංව සිටින්නා වූ කල්‍යාණ මිත්‍රයන්ට ආර්ය භාවයට ඉස්සෙල්ලාම පත් වූ සෝවාන් මාර්ග ඵල අවබෝධ කරගත් උත්තමයන්ට අරමුණු වන්නාවූ ද ඊළඟට ශෛක්ෂයන් හැටියට සකෘදාගාමී අනාගාමී ආර්යන් වහන්සේලාට අරමුණු වන්නාවූ මේ කොටස් පේළි හයක් අපි මේ පින්වතුන්ට මතක් කළා ආරම්මණ උපනිශ්‍රය කියන එක සිද්ධ වෙන විදිය.

මේ උපනිශ්‍රය ශක්තිය තේරුම් ගැනීමට මේ විදියටත් හිතන්න ඕනෑ. ඒ තමයි සෝවාන් ආර්ය උත්තමයන්ට තිබෙන්නේ ගරු කරන්න පුළුවන් මෙනෙහි කරන්න පුළුවන් අරමුණු ඔච්චරයිද? නෑ. තව තිබෙනවා. එදිනෙදා දකින කියන දේවල්, ඒවාගේම අහන කියන දේවල්, බණ ඇසීම් වගේ දේවල් සාමූහිකව ගත්තහම උන්වහන්සේලාට මේවා තමයි ගරු ආරම්මණ වෙන්නේ. මේවා තමයි වැදගත් වටිනා ආරම්මණ වෙන්නේ. ඒක නිසා අනිත් ඒවාට වඩා මේවාට තැනක් උන්වහන්සේලාගේ හිතේ ගොඩක් බලවත්ව වෙන් වෙනවා.

පෘතක්ජන කෙනෙක් මෙනෙහි කරනකොට ඒ හිතට මෙනෙහි වෙන්නේ මතුවෙන්නේ ලෞකික වශයෙන් කළාවූ පින්කම් ආදී දේවල්. දැන් අපි මේ කිව්වේ ආරම්මණ උපනිශ්‍රය ස්වභාවය.

ඊළඟට අපි තවත් එකකට යන්න ඕනෑ. ඒක හැබැයි වෙන විදියකටයි කියන්නේ. මේක මතක තබා ගන්න. ආරම්මණ උපනිශ්‍රය කියන එකේදී කියන්නේ ඉස්සරවෙලා කරපු දේවල් වෙච්ච දේවල් ඊළඟට ආරම්මණ වශයෙන් කොච්චර හයියක් තිබෙනවාද කියලා අරමුණු සම්බන්ධ කරලා තමයි කථා කළේ. නමුත් දැන් මේ කියන්න යන කාරණය අරමුණු පටලවා ගන්නේ නැතුව වෙන විදියකට තිබෙන්නේ. ඒ තමයි 'අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය'. අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය ගැන කියන කොට ආරම්මණ ප්‍රත්‍යය කථාවට ගිය විදියට යන්නේ නෑ.

**අනන්තර උපනිස්සය ප්‍රත්‍යය** –

1) **පුරිමා පුරිමා කුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං උපනිස්සයපච්චයෙන පච්චයො** = කලින් කලින්, පළමුවෙන් පළමුවෙන් පහළ උනාවූ

කුසල ස්කන්ධයෝ පසුව පසුව පහළ වන්නාවූ  කුසල ස්කන්ධයන්ට  බලවත් වූ අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා.

අපි ඉස්සෙල්ලා කිව්වේ **'පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං'** කියලා. එතැන කිව්වේ **කුසල ධර්ම** හැටියට. මෙතැන කියන්නේ **කුසල ස්කන්ධ** හැටියට. දෙකෙන්ම කියන කාරණය එකයි. කථා කරන භාෂාව වෙනයි.

**පුරිමා පුරිමා කුසලා ඛන්ධා -** පළමුවෙන් පළමුවෙන් පහළ උනාවූ කුසල ස්කන්ධයෝ එනම් චිත්ත චෛතසික ධර්මයෝ පසුව පසුව පහළ වෙන්නාවූ කුසල ස්කන්ධයන්ට බලවත් හේතුවක් වෙනවා. ඒ කියන්නේ ඉස්සර වෙලා පහළ උනාවූ කුසල් සිතක් නැති වෙනකොට ඒකට අනතුරුව ඒකට ගැවෙන්න අකුසල් සිතක් පහළ වෙන්නේ නෑ. ඒ හිත ඉවරවෙනකොටම ඒකට ගැලපෙන්නා වූ ඒ වර්ගයේ ළඟින් යන්නා වූ හිතක් තමයි පහළ කරන්නේ.

අපි කිව්වා කුසල් සිත් තිබෙනවා කියලා 21. ඒ කුසල් සිත් 21 තුල සාමූහිකව වැඩ කරන ක්‍රියාත්මක වෙන චෛතසික තිබෙනවා 38ක්. මේ ටිකට තමයි **කුසලා ස්කන්ධා** කියලා කියන්නේ. නමුත් මේ චෛතසික ධර්ම 38 එකට පහළ වෙන්නේ නෑ. **සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික** කියන හිත ජවන් හිතක්. ඒ ජවන් සිත ඉස්සරවෙලාම පහළ වෙනවා. ඒ පහළ වෙන ජවන් සිත ඊට පස්සේ ඒ සිතේ තිබෙන මහා විසාල හයියක් ලබා දෙනවා දෙවෙනි සිතට. ඊළඟට ඒ දෙවෙනි සිත පහළ උනාට පස්සේ ඒ දෙවෙනි හිත තුන්වෙනි හිතට මහා හයියක් ලබා දෙනවා. වෙනස් වෙන්න දෙන්නේ නෑ. ඊට පස්සේ තුන්වෙනි එක හතරවෙනි එකට, හතර වෙනි එක පස් වෙනි එකට, පස් වෙනි එක හය වෙනි එකට ආදී වශයෙන් මේ විදියට පිළිවෙලකට හත්වෙනි ජවන් සිත දක්වාම උපනිශ්‍රය ප්‍රත්‍යය හයියක් ගැම්මක් ලබා දෙනවා. එහෙම නැති උනා නම් එකෙන් දෙකෙන් නවතිනවා. එහෙම වෙන්නේ නැත්තේ මේ කුසල ස්කන්ධයන්ට ඉස්සරහට යන්න පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නා වූ ස්කන්ධ පසු සිතට බලවත් උපකාර ශක්තියක් ප්‍රධානය කරන නිසයි. මේ නිසා මේක නවතින්නේ නෑ. දැන් මේ වේලාවේදී අපිට පහළ වෙලා තිබෙන හිත මෙතැනින් නවතින්නේ නැත්තේ මේක දුර්වල වෙන්නෙත් නැත්තේ ඉස්සෙල්ලා සිතේ හයියක් අපිට ලබා දීලා මේක මතු කරපු නිසා. ඒක නිසා කියනවා පළවෙනි පළවෙනි ස්කන්ධයෝ පසුව පසුව පහළ වෙන ස්කන්ධයන්ට මහා බලවත් උප්නිශ්‍රයක් ඇති කරනවා කියලා.

## 2) අනුලොමං ගොත්‍රභුස්ස අනන්තර උපනිස්සයපච්චයෙන පච්චයො

සෝවාන් වෙන අවස්ථාවේදී නිර්වාණය පැත්තට හිත හරවන චිත්තය තමයි ගෝත්‍ර භූ සිත. ඒ ගෝත්‍ර භූ සිත හොඳ වටිනා ලෝකෝත්තර පැත්තට හැරිච්ච හිතක්. ඊට කළින් පහළ වෙනවා 'අනුලෝම හිත' කියලා හිතක්. ඒක කාමාවචර හිතක්. නමුත් මේ අනුලෝම හිත කියන හිත ආවට ගියාට පහළ කරගන්න බෑ. අනුලෝම හිතක් කියන එක ධ්‍යානයක ඇරෙන්න ලෝකෝත්තර චිත්ත වීථියක පහළ වෙනවා නම් ගෝත්‍ර භූ සිතක් පහළ කරන්න ගැලපෙන විදියටම හයියට පහළ වෙන්න ඕන. **අනුලොමං ගොත්‍රභුස්ස අනන්තර**

**උපනිස්සයපච්චයෙන පච්චයො -** අනුලෝම හිත පහළ උන ගමන්ම ඊළඟට පහළ වෙන්නේ ගෝත්‍ර භූ සිත. ගෝත්‍ර භූ සිතට හරි හයියක් ලබා දෙනවා අනුලෝම සිත.

ඊළඟට ඉහළ මාර්ගයකට ගියොත්

3) **අනුලොමං වොදානස්ස අනන්තර උපනිස්සයපච්චයෙන පච්චයො** = අනුලෝම හිත වෝදාන සිතට එනම් පිරිසිදු සිතට අනන්තර උපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා.

4) **ගොත්‍රභූ මග්ගස්ස අනන්තර උපනිස්සයපච්චයෙන පච්චයො** = ගෝත්‍ර භූ සිත ඊට පසුව පහළ වෙන සෝවාන් මාර්ග චිත්තයට අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

5) **වොදානං මග්ගස්ස අනන්තර උපනිස්සයපච්චයෙන පච්චයො** = සකෘදාගාමී අනාගාමී අරහත් යන මාර්ග චිත්ත වීථි වල වොදාන සිත ඊට පසුව පහළ වන මාර්ග චිත්තයට අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා.

සකෘදාගාමී හිතත් අනාගාමී හිතත් උපරිමයට ගියාට වූ රහතන්වහන්සේලාගේ පහළ වෙන රහත් හිතටත් කලින් පහළ වෙන්නේ නිර්වාණය හසුකර දෙන්නා වූ වෝදාන සිතයි. ඊට පස්සේ තමයි මාර්ග සිත පහළ වෙන්නේ. වෝදාන සිත නිර්වාණයට හැරෙන සිතයි. මාර්ග සිතේ තමයි කෙළෙස් නසන ගතිය තිබෙන්නේ.

මේ කියන්නා වූ 'අනුලෝම සිත' 'ගෝත්‍ර භූ සිතට සහ වෝදාන සිතටත්' 'ගෝත්‍ර භූ සිත' සහ 'වෝදාන සිත' කියන සිත් ඊළඟට පහළ වෙන මාර්ග සිතටත් **අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා.**

මේ කථාවේදී අපි තේරුම් ගන්න ඕනෑ මේක කොටස් තුනකට විස්තර කරන බව. එකක් තමයි 'ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය' වශයෙන්, 'අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය' වශයෙන් සහ 'ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යය' වශයෙන්. මේක තුන් ආකාරයකට කියන්න පුළුවන්. ධර්ම දේශනාවකදී සාමාන්‍ය ජනයාට කථා කරනකොට ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් හොඳට ගැලපෙනවා. ඒක සිද්ධියකුත් වෙනවා. චිත්ත චෛතසික ධර්මයන් හොඳට අධ්‍යනය කරලා ඒවා ගැන හොඳ වැටහීමක් හදාගෙන තිබෙන අයට අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය වටිනවා. ඒක තමයි ඒ අයට ගැලපෙන හොඳම තැන. සූත්‍ර ධර්ම ඉගෙන ගෙන කියාගෙන සද්ධා ආදී ගුණ ධර්ම පිළිබඳව හැදින්වීමක් තිබෙන අයට පකති උපනිශ්‍රය පිළිබඳව කියලා දෙනකොට හොඳට වැටහෙනවා.

තව තිබෙනවා මේ උපනිශ්‍රය ප්‍රත්‍යය සම්බන්ධයෙන් වීථි ටිකක් කියන්න. ඒ පිළිබඳව ඉස්සරහට කථා කරනවා. ඒ නිසා අදට මේ පින්වතුන්ට මේ ටික ප්‍රමාණවත් වෙයි කියලා අපි විස්වාස කරනවා අද දවසේ හැටියට. මේක අවසානය නොවෙයි. ඉතින් මේ පින්වත් සැම දෙනාටම ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ මේ අවබෝධය, මේ චිත්ත චෛතසිකයන් ඊළඟට ඊළඟට පහළ වෙන චිත්ත චෛතසික ධර්මයන්ට බලපාන විදිය

පිළිබඳව කරලා තිබෙන කථා විග්‍රහය, ඒවාගේම ඒවායේ තිබෙන ගුණ සහ ඒවායේ තිබෙන්නා වූ ඇඟී සහ ඒ ගැන කරලා තිබෙන විස්තර මේ විදියට අසාගන්න ලැබෙන්නේ පෙර පිනක බලයෙන්. ඒවාගේම තමයි හිත බොහෝම සියුම් දේවල් පිළිබඳව යවලා විග්‍රහත්මකව බලලා තිබෙනවා, ඒකෙ ප්‍රතිපලයක් වශයෙන්.

ඒ නිසා ඒ බුදුරජාණන්වහන්සේගේ නුවණින් සාරිපුත්ත මහරහතන්වහන්සේගේ සියුම් වූ නුවණින් සපර්ශකොට අපිට කියලා දීලා තිබෙන ධර්ම කොට්ඨාශය මේ පින්වතුන්ට අසාගන්න ලැබුණා අදට ප්‍රයෝජනවත් වෙන පරිද්දෙන්. මේ විදියට අපිට ධර්මය අසාගෙන මෙනෙහි කරගෙන හිතාගෙන ඒවා තුලින් ක්‍රියාත්මක වෙන විදියත් අවබෝධ කොටගෙන සසර දුකෙන් මිදී නිවනෙන් සැනසෙන්න ලැබේවා! නිර්වාණ අවබෝධය පිණිස මේ ඇසූ පිනත් මෙනෙහි කළ පිනත් හේතු වාසනා වේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

<u>ජයන්ත මහත්මයා</u> - ස්වාමීන්වහන්සේ අපිට දන්වා සිටියා පැයක පමණ කාලයක් තමයි අද අපි වෙනුවෙන් මිඩංගු කරන්න හැකියාව තිබෙන්නේ කියලා. ඒ අනුව ඒ කාලය දැන් ඉක්මවීගෙන යනවා. ඉතින් ස්වාමීන්වහන්ස අදත් අපිට වෙනදා වගේම ඔබවහන්සේ ඉතාමත්ම විස්තරාත්මකව ඒ දහම් කරුණු ඉදිරිපත් කළා. අපිට කියලා දුන්නා. ඒ ධර්ම දානමය කුසලය ඔබ වහන්සේ පතන බෝධියකින් නිර්වාණ ධාතුව සාක්ෂාත් වීම සඳහාම උපනිශ්‍රය වේවා! කියලා අපි ප්‍රාර්ථනා කරනවා සවනට සිසිලස වෙනුවෙනුත් සියලුම කල්‍යාණ මිත්‍රයන් වෙනුවෙනුත්. එහෙම නම් ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට ඉතාමත් ගෞරවයෙන් යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන ලෙස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්ස</u> - හොඳයි පින්වත්නි සැප වේවා! ඉතිං අද මේ පැවැත්වූ දේසනාවත් අපිට මේ මාධ්‍ය හරහා ඉදිරිපත් කරන්න අවස්ථාව සැලසුනේ පින්වත් ලලිත් මහත්මයා නිසා. ලලිත් දළුවත්ත මහත්මයාටත් ඒවාගේම මෙහෙය වීම් කටයුතු කරන්නා වූ පින්වත් ජයන්ත මහත්මයා ඇතුළු සැම දෙනාටමත් ඒවාගේම අසාගෙන සිටින්නා වූ සැම දෙනාටමත් විශේෂයෙන්ම ධර්ම අවබෝධය පිණිස වේවා! ධර්මය පතුරුවනවා වගේම ධර්මය අනිත් අයට කියලා දෙනවා වගේම අහනවා වගේම තමන්ගේ ජීවිතියට සම්බන්ධ කරලා මේ දහම් කරුණු තේරුම් ගන්න වටහා ගන්න හිත යොදන්නත් හැම දෙනාටම ශක්තිය ලැබේවා! පුණ්‍ය වාසනාවක් අපි හැම කෙනාටම ලැබී තිබෙන්නේ. ඒ නිසා අපේ පින්වත් දළුවත්ත මහත්මයා ප්‍රධාන මේ පින්වත් සැම දෙනාටම මේ උතුම් ධර්ම මාර්ගයේ තවත් අවබෝධයෙන් ඉස්සරහට ගිහිල්ලා අකම්පිත හිතක් හදාගෙන සසර දුකෙන් මිදිලා ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා පසේ බුදුරජාණන් වහන්සේලා රහතන්වහන්සේලා විසින් ශාන්තයි සැපයි හොඳයි කියා අවබෝධකොට ගත්තා වූ ඒ නිර්වාණ ධාතුව, සැප ඇති ශාන්ත වූ අසංඛත නිර්වාණ ධාතුව නුවණින් ස්පර්ශ කරන්න අපිට අවස්ථාව ලැබේවා! නිර්වාණ අවබෝධය පිණිස මේ පින් හේතු වේවා! කියලා මෛත්‍රීයෙන් පිං දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම සැනසිල්ලක් වේවා!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං – පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභේන මයා ලද්දං – පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං – ආගතං පටිපාටියා
සද්ධා ශීලං දයා වාසං – බුද්ධ පුත්තං නමාමහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.